www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද නියෝජිත මන්ඩලය චීන විරෝධී වෙලඳ යුද්ධ පනතක් සම්මත කරයි.

**US House passes anti-China trade war bil**

බැරී ග්‍රේ විසිනි.
2010 සැප්තැම්බර් 30

කිසියම් රටක මුදල් ඒකකය "මූලිකවම අවතක්සේරු" කර ඇති බවට පැවසේ නම් එම රට විසින් එජයට කෙරෙන ආනයන මත දඩ මුදල් පනවන්නට නිලධාරී මඩුල්ලට බලය පවරන පනතක් එජ නියෝජිත මන්ඩලය බදාදා දින සම්මත කලේය. ඩිමොක්‍රටික් නායකත්වය විසින් පෙරට ගෙන එන ලද මෙම වැඩපිලිවෙලට රිපබ්ලිකන්වරුන්ගේ සැලකියයුතු සහයෝගයක් සමග ඩිමොක්‍රටික කොංග්‍රස් සභිකයන්ගේ දැවැන්ත සහයෝගයක් ලබා ගත්තේය.

රිපබ්ලිකන්වරු 99 ක් ඩිමොක්‍රටිකවරු 249 ක් සමග පනතට පක්ෂව ඡන්දය භාවිතා කල අතර රිපබ්ලිකන්වරු 74 ක් ඩිමොක්‍රටිකවරු පහක් සමග "විරුද්ධ" වීමෙන් 348 ට 79 ක් ලෙස පනත සම්මත විය.

මෙම පනත විවෘතවම චීනයට එරෙහිව යැමක් වන්නේ තම මුදල් ඒකකය වන රෙන්මින්බියෙහි හුවමාරු අනුපාතය වඩා සීඝ්‍රයෙන් ඉහල නංවන ලෙස ඔබාමා පාලනාධිකාරයෙන් කෙරෙන මහත් වූ බලපෑම නිසයි. එමගින් එජයට කෙරෙන චීන ආනයනවල මිල අධික වනු ඇති අතර එජයෙන් චීනයට කෙරෙන ආනයනවල මිල පහල යනු ඇත.

නොවැම්බරයේ මධ්‍යකාලීන මැතිවරනයෙන් පසු සෙනෙට් මන්ඩලයේ ඉදිරි දැක්ම පැහැදිලි නොමැති බැවින් පනත සම්බන්ධව ධවල මන්දිරය කිසිදු අස්ථානයක් ගෙන නැති නමුත්, ඔබාමා සහ භාන්ඩාගාර ලේකම් තිමොති ගෙයිත්නර්, වැඩපිලිවෙල ඉදිරියට ගෙනයන්නට නියෝජිත මන්ඩලයේ ඩිමොක්‍රටික් නායකයන්ට ඇඟට දැනෙන තල්ලුවක් දුන්හ.

සැප්තැම්බර් 16 දා කොංග්‍රස් මන්ඩලය ඉදිරියේ සාක්ෂිදෙමින් රෙන්මින්බි අවතක්සේරු කල යුතු බවත් එහි හුවමාරු අනුපාතය ඉහල දැමීමට චීනය වඩා සීඝ්‍රයෙන් ක්‍රියා කල යුතු බවටත් ගෙයිත්නර් අවධාරනය කලේය. ජූනි වලදී කල සියයට 2 ක ඉහල දැමීමට වඩා වැඩි ප්‍රමානයකින් තම මුදල් ඒකකය ප්‍රති-අගය කිරීම චීනය ප්‍රතික්ෂේප කලහොත්, ඇමෙරිකානු වෙලඳපොලට චීනයේ පිවිසුම සීමා කරන්නට එජය ක්‍රියාමාර්ග ගනු ඇති බවට ඔහු ඉඟි කලේය.

නියෝජිත මන්ඩල ඡන්ද විමසීම පැවැත්වූ බදාදා දින ඉයෝවාහි නගර ශාලා උත්සවයක කතා කරමින් ඔබාමා, චීන මුදල් ඒකකය අවතක්සේරු කර ඇති බවට පැවසූ අතර "අපේ භාන්ඩ එහි මිල අධික වන ලෙසත් ඔවුන්ගේ භාන්ඩ මෙහි ලාබයට විකිනෙන ලෙසත් තම මුදල් ඒකකය ඔවුන් කලමනාකරනය කරන බවට මිනිස්සු හිතනවා." යනුවෙන් ඊට එක් කලේය.

සැප්තැම්බර් 24 වනදා නිව්යෝර්ක්හි පැවති එක්සත් ජාතීන්ගේ සැසිවාරයේදී ඔබාමා චීන අගමැති වෙන් ජියාබාවෝ හමුවූ අතර මුදල් ඒකක කාරනාව සම්බන්ධව ඔහුට පීඩනය දැමීය. නියෝජිත මන්ඩල වැඩපිලිවෙල චීනයට එරෙහිව බලපෑම් දැමීමේ මුක්කුවක් ලෙස යොදා ගැනීමට ඔබාමා සැලසුම් කරයි. නොවැම්බර් 10 -11 දිනවල දකුනු කොරියාවේ සියොල්හිදී පැවැත්වීමට නියමිත ජී20 සමුලුවේදී, චීනයට තම මුදල් ඒකකය ප්‍රති-අගය කරන්නට බලකිරීමට අන්තර්ජාතික සහයෝගය පෙලගස්වන්නට වොෂින්ටනය බලාපොරොත්තුවෙන් සිටී.

සෙනෙට් මන්ඩලය විසින් සම්මත කර නීතිගත කලත්, පනතින් එජ-චීන වෙලඳම කෙරෙහි එල්ල වනු ඇත්තේ අඩු සෘජු බලපෑමකි. පනත නියෝජිත මන්ඩලයට ඉදිරිපත් කරන්නට පෙරාතුව, තම මුදල් ඒකකය අවතක්සේරු කර ඇති රටකට එරෙහිව ප්‍රතිවිරෝධන (countervailing) බදු පනවන්නට රජයට ඇති ප්‍රතිපාදන මාර්ග සහ ආධාර කමිටුව විසින් ඉවත් කර ඇත. ඒ වෙනුවට, මුදල් ඒකකය අවතක්සේරු කර ඇති රටවල් නීති විරෝධී වෙලඳ ආයතන ලෙස හඳුන්වන්නට වානිජ දෙපාර්තමේන්තුවට ඉඩ ලැබෙන අතර චෝදනාලත් රටට එරෙහිව දඩ මුදල් අයකරන ආකාරයෙන් ආනයනික භාන්ඩ නිපදවන එජ සමාගම්වලට රජයෙන් සහනාධාර ඉල්ලා පෙත්සම් ඉදිරිපත් කිරීමට ඉඩකඩ සැලසී තිබේ.

චීනයෙන් ආනයන කෙරෙන බොහෝ භාන්ඩ තවදුරටත් එජයේ නිපදවන්නේ නැති නිසා, චීනයෙන් දිනකට කෙරෙන ඩොලර් බිලියනයක ආනයන සැලකුවිට, පනතින් වසරකට බදු ලෙස ලැබෙනුයේ ඩොලර් මිලියන 20 කට වඩා අඩු ආදායමක් බව කොංග්‍රස් අයවැය කාර්යාලය ඇස්තමේන්තු කරයි.

කෙසේවුවද, පනත චීනය සමග විවෘත වෙලඳ

යුද්ධයක් සඳහා වන මූලික පියවරක් නිරූපනය කරන අතර එය ජාත්‍යන්තරව තරගකාරී අවතක්සේරු සහ ආරක්ෂනවාදී වැඩපිළිවෙලවල් පැතිරීම ඉහල නංවනු ඇත. එය ලෝක වෙළඳ සංවිධානයේ ජාත්‍යන්තර වෙළඳම් නීති සහ ප්‍රතිපාදනයන් නින්දිතව උල්ලංඝනයකි.

නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විශේෂඥයෙක් වන රොබට් මුන්ඩල් බ්ලූම්බර්ග් රූපවාහිනියට පැවසුවේ, පනත "ලෝක ආර්ථිකයට සහ ආසියාවේ ස්ථාවරත්වයට දැඩි හානිකර තත්වයක් නිර්මානය කරනු ඇත. කිසියම් නීතිමය රාමුවක් හරහා, තවක් රටකට සාපේක්ෂව තම රටෙහි මුදල් ඒකකය ඉහල නැංවීමට බලකරවීම ආර්ථික ඉතිහාසයේ මින් පෙර සිදු නොවූ දෙයකි." ඔහු ඊට එකතු කලේය.

නොවැම්බර් 2 ට නියමිත කොංග්‍රස් මැතිවරනයට මාසයකට පෙර පනත ඉදිරිපත් කිරීමට තෝරාගැනීම, එහි කොංග්‍රස් ආධාරකරුවන්ගේ කෙටිකාලීන දේශපාලන අවශ්‍යතා පිලිබිඹු කරයි. විශේෂයෙන්ම ඩිමොක්‍රටික්වරු ද, කර්මාන්ත ප්‍රදේශවල රිපබ්ලිකන්වරු ද, ඇමෙරිකානු රැකියාවල ගැලවුම්කරුවන් ලෙස කපටි ආරක්ෂකයින් අන්දමට පෙනීසිටීමට සහ මහජන විරැකියාවේ වැරද්ද චීනය මත පැටවීමට වැඩපිළිවෙල අල්ලා ගත්හ.

නියෝජිත මන්ඩලය අමතමින් නැන්සි පෙලොසි පැවසුවේ, "අපි මෙය කරන්නේ, චීන ආන්ඩුව තරාදියෙන් තම ඇඟිල්ල ඉවත්කරගෙන තම මුදල් ඒකකයට වෙළඳපොල බලවේගවලට ප්‍රතිචාර දක්වන්නට ඉඩ සැලසූවහොත්, මිලියනයක ඇමෙරිකානු රැකියා උත්පාදනය කල හැකි නිසයි."

මේ උත්සාහය, විරැකියාවෙන් පෙලෙන්නන්ට රැකියා හෝ ස්ථාවර සහනාධාර සම්පාදනය රජය ප්‍රතික්ෂේප කිරීම තුලින් මතුවූ මහජන විරෝධය ඇමෙරිකානු පාලක පැලැන්තියෙන් හා එජ රජයෙන් වෙනතකට හරවන්නටත් එය වෙනත් විදේශ රාක්ෂයෙකුට එරෙහිව දිශාගත කරන්නටය. ඩොලර් ට්‍රිලියන ගනනක බදු ගෙවන්නන්ගේ මුදල් වෝල් ස්ට්‍රීට් වෙත හැරෙව්වේත් රැකියා සහ පාසල් සඳහා දැන් "මුදල් නැති" බව සහ මූල්‍යමය අර්බුදයට ලක්වූවන්ගේ නිවාස බැංකු වෙත උකසට සින්න වීම නවතන්නට කිසිවක් කල නොහැකි බව ප්‍රකාශ කරන්නේත්, මැතිවරන ව්‍යාපාරවලට ලැබුනු ආයතනික ආධාර සහ වෙනත් ආකාරයේ අල්ලස් විසින් මූල්‍යාධාර ලැබූ, මෙම දේශපාලකයින්මය.

එජ නිෂ්පාදන නැවත පනගස්වන්නට ඇරඹූ තම "ඇමෙරිකාවේ සාදමු" වැඩසටහනෙහි කොටසක් ලෙස ඩිමොක්‍රටික්වරු පනත ඉදිරියට තල්ලු කලේය. එජ කම්කරුවන්ගේ වැටුප් සැලකිය යුතු මට්ටමට කපාහරිමින් සහ ඔවුන්ව සූරාකෑම ඉහල නංවමින්, එමගින් එජයේ සහ ආසියාවේ ඊනියා නැගීඑන ආර්ථිකයන් අතර ශ්‍රම වේතන වෙනස පටු කිරීම තුලින් ඉදිරි වසර පහේදී එජ අපනයන දෙගුනයක් කරා ලඟාවීම මෙම ප්‍රතිපත්තියෙහි මධ්‍ය ලක්ෂ්‍යයයි.

ආර්ථික ජාතිකවාදයේ සහ ස්වෝත්තමවාදයේ මෙම ප්‍රචාරනයට වෘත්තීය සමිතිවල සම්පූර්න සහයෝගය ලැබී තිබේ. පිරිසිදු බලශක්ති තාක්ෂනයන් සම්බන්ධව එජ සමාගම්වලට චීනය වෙනස්කම් කරන බවට එක්සත් වානේකම්කරු සමිතිය විසින් කරන ලද පැමිනිල්ලට බකිම දෙන්නයැයි බලකරමින් නියෝජිත මන්ඩල සාමාජිකයන් 181 දෙනෙක් ඔබාමාට අඟහරුවාදා ලිපියක් යැවීය.

ජාත්‍යන්තර වෙළඳම් සහ මුදල් යුදවැදීමක් කරා යන අවරෝහනයක් නිරූපනය කරන වර්ධනයවීම් ගනනාවක මෑතකම සිද්ධිය මෙම පනතය. බ්‍රසීල මුදල් ඇමති ගයිඩෝ මන්ටෙගා සඳුදා පැවසුවේ, "අපි සාමාන්‍ය මුදලේ අගය දුර්වලවීමක එනම් ජාත්‍යන්තර මුදල් යුද්ධයක් මධ්‍යයේ සිටිමු. අපගේ තරගකාරිත්වය අපෙන් ඈත් කරන නිසා එය අපට තර්ජනයකි."

එජ, යුරෝපා සහ චීන ලාබ මුදල් ප්‍රතිපත්තියේ ප්‍රතිපලයක් ලෙස, පසුගිය වසර පුරා ඩොලරයට එරෙහිව සියයට 30 ක ඉහලයාමත් ඇතුලත්ව, ලෝකයේ ප්‍රධාන මුදල් ඒකකවලට එරෙහිව බ්‍රසීලය තම මුදලේ නියම වටිනාකමෙහි සීඝ්‍ර ඉහලයාමක් දකී. එහි ප්‍රතිපලයක් ලෙස, ලෝක වෙළඳපොලට වඩා වැඩි අගයක් ගන්නා බ්‍රසීල අපනයන තර්ජනයකට ලක්ව තිබේ.

සිදුවෙමින් පවතින දේ ඉතා පැහැදිලි බව මනිටෙගා විවෘතව පැවසීය. එකතැන පල්වන වර්ධනය සහ එකතැන පල්වන වෙළඳපොල තත්වයන් යටතේ, තරගකාරී වෙළඳ වාසියක් ලබාගැනීම සඳහා, ප්‍රධාන ආර්ථිකයන් සියල්ලම තම මුදලේ විනිමය අනුපාතය පහල දැමීමට උත්සාහ ගනිමින් සිටිති. ලාබ ඩොලර් ප්‍රතිපත්තිය අනුගමනය කරමින් එක්සත් ජනපදය එහි මූලිකත්වය ගෙන ඇත. ජූනි මාසයේ සිට මුදල් බොහොමයකට එරෙහිව ඩොලරය සියයට 11 කින් පහත ගොස් ඇති අතර පෙබරවාරියේ සිට එය දැන් තම පහතම මට්ටමේ තිබේ.

අපනයන මත රැඳෙන ජර්මනිය පෙරටු කර ගත් යුරෝපය යුරෝවට ද එම දෙයම කරමින් සිටී. මැයි මාසයේ සිට, ඩොලරයට සාපේක්ෂව යෙන්හි අගය ඉහල ගිය අතර, ජපානය සුමාන දෙකකට පෙර, එහි විනිමය අනුපාතය බලාත්කාරයෙන් පහත හෙලීමට යෙන් ට්‍රිලියන 1 ක් විකුනමින් ඒකපාක්ෂිකව මුදල් වෙළඳපොලට මැදිහත් විය.

දින හතරකට පසුව හමුවූ ෆෙඩරල් රිසර්ව් මන්ඩලය එජ උද්ධමන අනුපාතය ඉහල දැමීමේ අරමුනින්, එහි කොටසක් ලෙස, වඩා උත්ප්‍රේරකශීලී මුදල් ප්‍රතිපත්තියකට සංඥාකරමින් ප්‍රකාශනයක් නිකුත් කලේය. ජපානය මුදල් වෙළඳපොලට මැදිහත්වීමේ ප්‍රතිපලයක් ලෙස යෙන් අගයේ සියයට 3 ක අඩුවීම ඉක්මනින් ආපසු හරවමින්, ඩොලර්වල නව විකිනීමකට

උනන්දු කරවන අභිප්‍රායික බලපෑමක් එහි විය.

පනතෙහි සංක්‍රමනයත් සමග, එජ සහ චීනය අතර පමනක් නොව, සියලු ප්‍රධාන ආර්ථික බලවතුන් අතර ද, ප්‍රතිප්‍රහාර දෙන අන්දමේ මුදල් සහ වෙලඳ වැඩපිලිවෙලවල් සඳහා පසුබිම සැකසී ඇත.

ලෝක ධනවාදයේ වැඩිවන ප්‍රතිවිරෝධතා සහ සමස්ත අර්බුදයෙහි වැදගත්කම යටතේ ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමය බිඳවැටෙමින් පවතී. ට්‍රෝයි අවුන්සයක් දැන් ඩොලර් 1,300 කට වඩා වැඩි සහ දිනපතාම නව වාර්තා තබන, රත්‍රන් මිලෙහි සීඝ්‍ර වර්ධනය මෙම ක්‍රියාදාමයේ පැහැදිලි ප්‍රකාශනයකි.

සඳුදා වෝල්ස්ට්‍රීට් ජර්නලය ප්‍රකාශකලේ, "ඇත්තටම විශ්වාසදායී පිලිසරන රත්‍රන් ලෙස බොහෝ ආයෝජකයින් වටහා ගෙන ඇති අතර එලඹෙන කාලසීමාවලදී වාර්තා බිඳහෙලන මට්ටමේ ඉහලකට එහි නැගීම දිගටම පවතීවි යන්න ප්‍රධාන විශ්ලේෂකයෝ විශ්වාස කරති."

"අරගලයක නිරත ආර්ථිකයන්ට මුක්කුගැසීමේ තම උත්සාහයන් මත ලෝකය පුරා මූල්‍ය බලධාරීන් සිතියම් රහිත භූමි ප්‍රදේශයකට ගමන් කරන බැවින්, අවසන් ආරක්ෂිත ස්වර්ගයේ පෙරනොවූ විරූ ශක්තිය ආයෝජකයන්ගේ අස්ථිරත්වයට සාක්ෂියකි. ඔවුන්ගේ උපක්‍රමයන් කෙතරම් විවිධාකාරී වුවද, තම මුදල් අවප්‍රමාන කිරීමේ උපක්‍රමයන් හඹායෑමේදී මහ බැංකු සහ අනෙකුත් තීරන ගන්නන් එක්සත් වී ඇති බවට පෙනීම එකම ස්ථිර තත්වයයි."

"අපි පැහැදිලිවම තරගකාරී අවප්‍රමානගත කිරීමක සිටිමු." ටොරොන්ටෝහි සිග්නේචර් ග්ලෝබල් ඇඩ්වයිසර්හි ධූර කලමනාකරන අංශයේ උප සභාපති ඩෘමන්ඩ් බ්‍රෝඩුවර් පැවසීය.

තරගකාරී අවප්‍රමාන කිරීම් සහ "අසල්වැසියාගෙන් හිගන්න" ප්‍රතිපත්ති හේතුවෙන් ලෝක වෙලඳපොල ප්‍රතිවිරුද්ධ මුදල් සහ වෙලඳ කන්ඩායම් මතට බිඳෙන්නට පාරකැපුනු 1930 දී ලෝක මුල්‍ය ක්‍රමය අවසන් වරට ඇද වැටුනි. මහා අවපාතයේ ගැඹුරුවීම පමනක් නොව ජාත්‍යන්තර ආතතීන්ට ගිනි මෙලවීම් හරහා අවසාන වශයෙන් දෙවන ලෝක යුද්ධය පුපුරායාම එහි ප්‍රතිපලය විය.

© www.wsws.org